සුප්‍රකට ඉන්දීය නිළි රාණි මුඛර්ජි හා සිදුකළ සාකච්ඡාවක් හින්දුස්ථාන් ටයිම්ස් හි පළ වී තිබුණේ, "Rani Mukerji reveals she was insecure about her height and voice, how Kamal Haasan helped her break 'stereotypes'" යන සිරස්තලයෙනි.

මේ අතර, එම සාකච්ඡාවේදී රාණි මුඛර්ජි විසින් අනාවරණය කළ තොරතුරු ඇතුළත් ලිපියක් ඉරිදා ලංකාදීප සඳැල්ල අතිරේකයේ (2011 නොවැම්බර් 28 දින) පළවී තිබිණි. එහි සිරස්තලය වූයේ "මිටි රාණි" යන්නයි!

රාණි මුඛර්ජි එම සාකච්ඡාව තුළ කතාබහට ලක් කරන්නේ ද, තමන්ගේ ශරීර වෙනස්කම් සමගින් ඇතිවිය හැකි අනාරක්ෂිත හැඟීම් සහ ඇයට එම අනාරක්ෂිත හැඟීම නැති කර ගැනීමට සහාය ලැබුණු ආකාරයයි. නමුත්, ඉරිදා ලංකාදීප සඳැල්ල අතිරේකය ඒ පිළිබඳ ලිපියක්, "මිටි රාණි" යන සිරස්තලයෙන් යුතුව ඉදිරිපත් කරයි.

1) ඔබ සිතනා ලෙසට, මෙවැනි ලිපියක් සමඟ පළ වන එවැනි සිරස්තලයක් 'අසංවේදී' නොවන්නේ ද?

2) ඒ ඔස්සේ, මෙම ලිපියෙන් සිදුවිය යුතු ධනාත්මක බලපෑම වෙනුවට, තමන්ගේ ශරීරයේ වෙනස්කම් පිළිබඳ අනාරක්ෂිත හැඟීම් ඇති තවත් අයෙකුට මෙම සිරස්තලය ඍණාත්මක බලපෑමක් සිදු නොකරනු ඇතිද?

මෙම සිරස්තලය පිළිබඳ ඔබේ අදහස කුමක්ද?